# ගොවිතැනට අත දෙන

# කොම්පියුටරය

**කොම්පියුටර් යුගයට එළඹී ඇති මානව ශිෂ්ඨාචාරයේ අරුණාලෝකය දුන් අපේ රටටත් වැටී ඇත. මේ රටේ විවිධ අංශ කොම්පියුටර් හා තාක්ෂණයත් සමග ඉදිරියට යද්දී, මෙරටේ ඉතාම වැදගත් අංශය වන කෘෂිකර්මයටද, එම මහඟු ආධාරය ලබාගත යුතුය. මෙය තේරුම් ගත් ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, ගොවිකටයුතු ක්ෂේත්‍රය සඳහා නව කොම්පියුටර් මධ්‍යස්ථානයක් බිහිකර ඇත. ඒ පිළිබඳ විස්තරයකි මේ.**

නියෝජ්‍ය අධ්‍යක්ෂිකා
වී. ෂන්මුගම්
විසිනි.

සීඝ්‍රයෙන් සංවර්ධනය වන අපේ රටට සංවර්ධන තොරතුරු වල අවශ්‍යතාවය අමුතුවෙන් කිවයුතු නොවේ. මෙම සංවර්ධන ක්‍රියාදමයේ නියැලෙන රාජ්‍ය හා පෞද්ගලික ආයතන එම සංවර්ධන හා පරිපාලන ක්‍රියාදමයන්හි දී ඉතා විශාල තොරතුරු දත්ත ප්‍රමාණයක් ලබා දෙනවා. ඒවා එම ආයතන වල විවිධ ප්‍රකාශන හෝ වාර්තා මගින් ලබා ගත හැකියි.

මේ අතර මෙරටේ ගොවි කටයුතු ක්ෂේත්‍රයෙහි විවිධ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේආයතනද, විවිධ පර්යේෂණ වලින් හා සමීක්ෂණ වලින්ද තොරතුරු රාශියක් ලබා ගන්නවා. මෙම දත්තයන් ඒවා අවශ්‍ය අවශ්‍යතාවන් පහසුවෙන් ලබාගත හැකි ආකාරයට ගබඩා කළහොත් එම දත්ත වෙනත් සංවර්ධන අවශ්‍යතාවයන්ට ද ලබා ගත හැකියි. මෙබඳු අරමුණක් ඉටු කර ගැනීමේ පහසුම මාර්ගය වන්නේ එම දත්ත කොම්පියුටර් ආධාරයෙන් ගබඩා කිරීමෙනි.



කොම්පියුටරය ක්‍රියාත්මකවේ.

මෙම අවශ්‍යතාවය තේරුම් ගත් ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සංවර්ධන කටයුතු වල නියැලෙන ආයතනවල දත්ත අවශ්‍යතා සපිරීමට මධ්‍යස්ථානයක් ඇති කළහොත් වැදගත් සේවාවන් ඉටු කළ හැකි බවට අදහස් කරන ලදී. මෙම ආයතනය පිහිටුවීමේ එක් අරමුණක් වන ගොවි කටයුතු ක්ෂේත්‍රයෙහි තොරතුරු සම්බන්ධීකරණය ඉටු කිරීමේ අරමුණින්, ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය කොම්පියුටර දත්ත බැංකුවක් 1983 ජුනි මාසයේ දී ආරම්භ කරන ලදී.

මෙම දත්ත බැංකුව වර්ධනය කිරීම සඳහා ඇමෙරිකා එක්සත් ජනපදයේ ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සිය මගින් කොම්පියුටර් සේවාවන් ආයතනයට ලබා දෙන ලදී. මෙම ආයතනය මගින් සකස් කරන ලද (1) සංවර්ධන දර්ශක සහ (11) දත්ත කට්ටල මෙම කොම්පියුටරයේ ගබඩා කරන ලදී.

සංවර්ධන දර්ශක බැංකුව ප්‍රධාන අංශ 5 ක් යටතේ සැකසී ඇත. ඒ සමාජ, කෘෂිකාර්මික, ධීවර, වන සම්පත් හා කර්මාන්ත යනුවෙනි. ග්‍රාමීය ආර්ථිකයට ඇති දැඩි වැදගත්කම හා ඉඩම් භාවිතය හා ආහාර නිපදවීම මගින් කෘෂිකර්මයට ඇති සම්බන්ධතාවය නිසා ධීවර හා වන සම්පත් අංශ කෘෂිකාර්මික දත්ත සැළැසුම් ක්‍රියාවලියට අනුවම ද සකස් කර ඇත. කර්මාන්ත අංශයට මුලින්ම ඇතුළත් වන්නේ කෘෂි කර්මයට හා කෘෂි ආශ්‍රිත නිර්මාන වලට අවශ්‍ය යෙදවුම් සම්බන්ධිත දත්තය ධීවර හා වන සම්පත් අංශ දියුණුවීම එබඳු දත්ත ද ඇතුළත් කරනු ඇත. කෙසේ වුවද දැනට ආරම්භ කර ඇත්තේ සමාජ හා කෘෂිකාර්මික දත්ත එකතු කිරීමයි.

''සමාජ'' අංශය සකස් වී ඇත්තේ, පරිසරය, ජනාවාස සහ විවිධ සංඛ්‍යාන, ශ්‍රමය හා රැකියා, ආහාර, සෞඛ්‍ය, අධ්‍යාපනය, බල ශක්තිය ප්‍රවාහන හා සිහිකිරීම් ගැන බැංකු හා සමුපකාර සංවර්ධනය ආදී තොරතුරු ඇතුළත් වන ආකාරයටය. කෘෂිකාර්මික අංශයේ භෝග හා පශු සම්පත් දෙඅංශයේම දත්ත ඇතුළත්ය. මෙම අංශයේ පුළුල් තොරතුරු ඇතුළත් වන මෙම ක්‍රමය යටතේ එක් එක් භෝගයේ පෙර පශු පරම්පරාවල තොරතුරු ඇතුළත් වන මෙම ක්‍රමය යටතේ එක් එක් භෝගයේ හෝ පශු සම්පත් වල නිෂ්පාදනය හැකසීමේ හා අලෙවියේ දත්ත, ගොවිපල ජනගහනය හා ක්‍රියා කරුවන්, නීති පද්ධති, සහනාධාර යෝජනා ක්‍රම, කෘෂිකර්මයේ ආයෝජන හා පුහුණුව ආදී තොරතුරු ඇතුළත්ය.

සාමාන්‍යයෙන් තොරතුරු ලබා ගත හැක්කේ දිස්ත්‍රික්ක මට්ටමෙනි. කෘෂිකාර්මික ඵලදා වර්ධන මධ්‍යස්ථාන, ගොවිජන සේවා මධ්‍යස්ථාන හා ගම් වැනි දිස්ත්‍රික්ක ඒකක මට්ටමේ තොරතුරු සාමාන්‍ය අංශයට පෙර දල ආකාරයක දත්ත බැකුංව ලබාගෙන ඇත. මූලික වශයෙන් 1960 න් ආරම්භ වන කාල පරිච්ඡේදයේ අපේ තොරතුර ගබඩා කිරීම ආරම්භ කර ඇති වුවද, 1960 ට පෙර සමහර ඓතිහාසික දත්ත හා නීති පද්ධති වුවද ගබඩා කර ඇත.

මෙම දත්ත වලට අමතර යොදගන්නා ලද වචනවල අර්ථය, දත්ත එකතු කළ ආකාරය වැනි දත්ත තේරුම් ගැනීමට උපකාරී වන තොරතුරු ද දත්ත බැංකුව ප්‍රයෝජනයට ගන්නා අයහට සපයනු ඇත. මෙයට අමතරව ග්‍රාහනයට වෙනත් සේවාද සැපයේ. දත්ත බැංකුවට බාහිරව ඇති තොරතුරු ලබා දීමද, දත්ත රැස් කරන්නන් අතර සම්බන්ධතාවය ද ලෙස කටයුතු කරමින් නව ඉල්ලුම් පතට පවතින දත්ත වල තොරතුරු වල ප්‍රමාණවත් නොවන බව ඇතිවීම ආදියද ඒ අතර වේ.

එහෙයින් දත්ත කොම්පියුටර් මධ්‍යස්ථානයක් බිහි වීමේ ප්‍රයෝජන ඉමහත්ය. දත්ත එකතු කිරීමට ද වෙනස හා කාලය ඉතුරු කරගෙන තනතුරට අවශ්‍ය දත්ත ලබාගත හැකියි. කොම්-පියුටරයෙන් ලැබෙන නිසා සැපයීම කඩිනම්ය. විවිධ උපයෝගී කරගන්නන් අතර අන්තර් ක්‍රියාකාරිත්වය නිසා තොරතුරු වල අසම භාවය තේරුම් ගත හැකිය. ඒ අනුව, නව දත්ත පරපුරේ ඇති වීමටද, මෙරටින් ලබා ගන්නා දත්ත වල තත්වය උසස් කිරීමට එමගින් ඉමහත් පිටු වහලක් ලැබී ඇත.

ගොවිකටයුතු ක්ෂෙත්‍රයේ සංවර්ධන පර්යේෂණ සැලසුම් හා ක්‍රියාත්මක කිරීම් වලට ආධාර කිරීම මෙම මධ්‍යස්ථානය පිහිටුවීමේ අරමුණය. එහෙයින් දැනට මෙම මධ්‍යස්ථානයේ සේවය විද්‍යාර්ථීන් පර්යේෂනයක, ප්‍රතිපත්ති සමන්විතය. සැළසුම් කරුවන් හා සංවර්ධන කටයුතු වල නිරතවන නිලධාරීන්ට ලබා දේ. ඉදිරි අනාගතයේදී ගොවීන්ට අවශ්‍ය තොරතුරු ඔවුන්ටම ලබා ගත හැකි ආකාරයට දියුණු කිරීමට බලාපොරොත්තු වෙමු.




මෙවැනි දත්ත ගොවි ජනතාවට වැදගත්ය.